# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරණලදී.

නො. 7,973 — 1933ක්වූ මාර්තු මස 24 වෙනි දිනවූ සිකුරාද.


## Part IV. — හතරවෙනි කාණ්ඩය.

### උපාඩ්ග නීති.

බල්ලන් ලියාපදිංචිකිරීම සම්බන්ධ 1901සේ ආඥාපණත.

1920සේ අංක 11 දරන පළාත් ආණ්ඩුසභා සම්බන්ධ ආඥාපණතේ 245 යන වගන්තිය හා බල්ලන් ලියාපදිංචිකිරීම සම්බන්ධ 1901සේ අංක 25 දරණ ආඥාපණතේ 5වෙනි 6වෙනි වගන්ති යටතෙහි පානදුරේ නගරබද ප්‍රදෙශසභාව විසින් සම්පාදනයකරනලද උපනීති.

ජී. ආර්. ඊ. ගුනතිලක,
සභාපති.

1933ක්වූ මාර්තු මස 8වෙනි දින පානදුරේ නගරබද ප්‍රදෙශසභා කන්තෝරුවේදීය.

### උපනීති.

1. පානදුරේ නගරබද ප්‍රදෙශසභාවට අයත් සීමා තුළ තබාගෙන සිටිනා සෑම බල්ලා නොහොත් බැල්ලී ගැන ඒ සතා රැකබලාගන්නා එසේ නැත්නම් අයිතිකාරව ඉන්නා අය විසින් ශත 50ක් බල්ලන් ලියාපද්ංචිකිරීම සඳහා අවුරුදු පතා ගෙවන ගාස්තුවක් වශයෙන් ගෙවිය යුතුය. මේ ව්‍යවස්ථාව උදෙසා අවුරුද්ද ගණිනුලබන්නේ එක් අවුරුද්දක අප්‍රෙල් මාසයේ 1වෙනිද සිට ඊළඟ අවුරුද්දේ මාර්තු මස 31වෙනිද වනතුරුය.

2. ලියාපදිංචිකිරීමේ ගාස්තු අයකිරීම සඳහා නගරබද ප්‍රදෙශසභාවේ සභාපතිතැන විසින් පත්කොට සිටින (මෙහි මින්මතු අයකරු යනුවෙන් හඳුන්වන) තැනැත්තාට එක් එක් අවුරුද්දේ ජනවාරි මාසේ 31වෙනිදට මත්තෙන් නගරය ඇතුළත සෑම ගෙදරකම වාසයකරන්නකු විසින් ඒ ගෙදර හෝ ගෙදරට ඇතුළත් අවට භූමියෙහි හෝ තබාගෙන සිටින එක් එක් බල්ලා හෝ බැල්ලිය සම්බන්ධව විස්තර කරුණු මීට යාකොට තිබෙන A ආකෘතිපත්‍රයෙහි උචමනාකරන පරිද්දෙන් සපයාදිය යුතුයි.

3. යටකී අයකරුට හෝ නගරබද ප්‍රදෙශසභාවේ ලේකම් තැනට හෝ නියමිත අයමුදල ගෙවූවිට B ආකෘතිපත්‍රයෙහිවූ පරිද්දෙන් ලියාපදිංචිකළ බවට සහතිකයක් දෙනුලැබේ.

4. (1) යම් බල්ලෙක් හෝ බැල්ලියක් හෝ ඉදින් :—

(*a*) අනිත් බල්ලන්වද බෝවියහැක්කේයයි අයකරු හෝ ලේකම්තැන කල්පනාකරන ප්‍රමාණයකට රෝගයක්න්පෙලේ නම් හෝ :

(*b*) වයස, ලෙඩ, තුවාල යන මෙයින් කිසිවක් නිසා තවත් ජීවත්ව සිටින්ට සුදුසුනැතැයි ඔහුට කල්පනාවේනම්, එබඳු බල්ලකු හෝ බැල්ලියක් සඳහා ලියාපදිංචිකිරීමේ සහතිකයක් නොදෙන්නට අයකරු හෝ ලේකම් තැනට පුළුවන, නැත්නම්:

(2) ලේකම්තැන හෝ අයකරු මැනවයි සලකන කොයිම නියමයකට නමුත් යටත්කොට සහතිකයක් දෙන්නටද ඔහුට පුළුවන. එසේ සහතිකය නොදී හැරීම ගැන හෝ නියමයන්ට යටහත්කිරීම ගැන නොසතුටුවූ බල්ලන් අයිතිකාරයකුට ඊට විරුද්ධව නගරබද ප්‍රදෙශසභාවේ සභාපතිතැන වෙත පැමිණිලිකර සිටින්නට පුළුවන. එවිට එසේ නොදී හැරීම හෝ නියමයන්ට යටහත්කිරීම ස්ථිරකරන්නට හෝ මදක් වෙනස් කරන්නට හෝ අවලංගුකරන්නට හෝ සභාපතිතැනට පුළුවන.

5. ලියාපදිංචිකිරීමේ සෑම සහතිකයම පහත සඳහන් නියමයන් මුද්‍රණයකොට තිබිය යුතුයි, එනම් :—

(*a*) සභාපතිතැනගේ කල්පනාවේ හැටියට තවත් ඉදිරියට ජීවත්ව සිටීමට සුදුසු නොවන අන්දමට බල්ලා තුවාලව හෝ රෝගාතුරව සිටීනම් එක්කෝ,

(*b*) ඒ බල්ලාගේ අයිතිකාරයා ඌට හිතිපතා හිරිහැර කරන බව හෝ ඌ ගැන සොයා නොබලන බව හෝ සභාපතිතැනට ඒත්තුගියේ නම් එක්කෝ,

(*c*) ඒ බල්ලා බෝවෙන හෝ පැතිරයන ලෙඩකින් පෙළෙමින් සිටියදී අනුන්ට අයිති වෙනත් බල්ලන් හා එකට හැවසෙන්නට ඌ අයිතිකාරයා විසින් ඉඩ හැරියේනම් මේ සහතිකය අවලංගුකරන්නට පානදුරේ නගරබද ප්‍රදෙශ සභාවේ සභාපති තැනට පුළුවන.

6. සහතිකයක් දෙන්නට බැරිය කියනුලැබ හෝ දෙනලද සහතිකයක නියමයන් අනුව ක්‍රියා නොකිරීම හේතුකොට ගෙණ එය අවලංගුකරනුලැබ හෝ සිටින බල්ලකු හෝ බැල්ලියක් රැකබලාගෙන ඉන්නෙක් හෝ අයිතිකාරයෙක් හෝ වීනම් ඔහු විසින් නගරබද ප්‍රදෙශසභාවෙන් ඒ සඳහා දැන්වීමක් ලත්විට එහි සඳහන් වේලාවට නගරබද ප්‍රදෙශසභාවේ කන්තෝරුවට ඒ බල්ලා හෝ බැල්ලී ගෙණගොස් උන් බාරගන්ට බලය ලබා සිටින නගරබද ප්‍රදෙශසභාවේ නිලධාරියකුට බාර දියයුතුයි. එවිට එබඳු බල්ලන් සම්බන්ධව සභාපතිතැන නියම කරන පරිද්දෙන් ක්‍රියාකරනු ලැබේ.

### A.—ආකෘති පත්‍රයකි.

**බල්ලන් සම්බන්ධව උපනීතිවල නියමිත ලේඛනයකි.**

ගෙදර අංකය :——

වීදිය :——

ගෙහිමියාගේ නම :——

| තමාගෙන සිටින බල්ලන්ගේ ගණන. | විස්තර | | | | | | අයිතිකාරයාගේ නම. | ගාස්තුව ගෙවූ දිනය. |
|---|---|---|---|---|---|---|---|---|
| | ජාතිය. | පිරිමි සතාද, ගැහැනු සතාද. | පාට. | බෙල්ලේ මහත. | විශේෂ ලකුණු. | බැඳිපුර කරුණු. | | |
| | | | | | | | | මාර්තු මස 31වෙනිද හෝ ඊට පෙර |

ආකෘති පත්‍රය බාරදුන් දවස :——.

——,
ගෙහිමියාගේ අත්සන.

19 —— දින පානදුරේදීය.

ඉහත සඳහන් ගෙහිමියා විසින් ඉහත සඳහන් පැවුල්පත්‍රය පුරවා සතියක් ඇතුලත එවිය යුතුයි. එසේ නොකර පැහැර හරින යම් කෙනෙක් විනම් ඒ අය රු. 20ක දඩයකට යටත් වියහැක.

——,
සභාපති.

19 —— දින පානදුරේ නගරබද
ප්‍රදේශසභා කන්තෝරුවේදීය.

---

### B.—ආකෘති පත්‍රය.

**බල්ලන් ලියාපදිංචිකිරීමේ සහතිකය.**

වීදිය : ——. ලියාපදිංචිකිරීමේ අංකය : —— අංක —— දරණ නම.

ගාහගෙහි වාසයකරණ ————, විසින් පහත සඳහන් විස්තර ඇති බල්ලකු/බැල්ලියක් මේ කන්තෝරුවෙහි ලියාපදිංචිකළ බවද, ඊට නියමවූ ගාස්තුවවූ ශත 50 ගෙවූ බවද මෙයින් සහතිකකරමි.

බල්ලාගේ/බැල්ලීගේ විස්තර :——.
ජාතිය : ——.
පිරිමි සතාද ගෑනු සතාද යන වග : ——.
පාට : ——.
බෙල්ලේ මහත : ——.
විශේෂ ලකුණු : ——.

මේ සහතිකය වර්ෂ 19 —— මාර්තු මස 31වෙනිද වනතුරු බල සහිතව පැවතේ.

——,
ලේකම්.

වර්ෂ 19 —— ක්වූ —— වෙනි දින පානදුරේ නාගරික ප්‍රදේශසභා කන්තෝරුවේදීය.

---

### ආණ්ඩුවේ ඉඩම් විකිණීම හෝ බදුදීම සඳහා දැන්වීම.

**No. 10,594, S. O.**—ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1933ක්වූ මැයි මස 18වෙනි දිනවූ බ්‍රහස්පතින්ද පෙරවරු 9ට බෙලිහුල්ඔය නානායමේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොයෙක් වෙන අන්දමකින් නිදහස්කරන්ට යෙදෙනවා ඇත. සබරගමු දිසාවේ රත්නපුර පලාතේ කඩවත කෝරළේ උඩුවිග්ගම්පත්තු කොටසගේ පිහිටා තිබෙන බිම්කැබලි 1.

ලංකාමැනීමේ මුල් පිහියගේ නො. 543. ගම—උඩගම.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා හෝ අයිතිකමකියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 157 | — .. | ආණ්ඩුව, සීමාසහිත අප්ලැන්ඩ්ස් තේවතු සමිතියේ වගාව (කොළඹ විටෝල් සහ සමාගම, ඒජන්තවරු) | කාර්තබන ගෙය (පාරට ඉතුරුකරපු බිම) | 0 0 1 |

අක්කරයක තක්සේරු මිල රුපියල් 100 දක්වාය.

මෙකී ඉඩම ගැන වැඩිදුර තොරතුරු ඉඩම් බේරුම්කරන කොමසාරිස් උන්නාන්සේගෙන්ද එහි සිතියම සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

වර්ෂ 1933ක්වූ මාර්තු මස 20වෙනි දින කොළඹ ඉඩම්
පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සී. වී. බ්‍රවුන්,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වමින.

---

### ආණ්ඩුවට ඉඩම් ලබාගැනීම සම්බන්ධ දැන්වීම.

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3වෙනි ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:— අඹේපුස්ස ටවුන්එකේ ලිඳක් සෑදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" නමවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන් වහන්සේගෙන් නිසියාකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩම නම් :—

මුල් සිතියමේ A 42. ගම—කිනදෙනිය.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 2 | ගලබොඩවත්ත | ලිඳක් (තාවකාලික) ඇති ඉඩම | ගරුකටයුතු බී. ඇස්. සේනානායක මැතිතුමා, බෝතලේ | 0 0 0·9 |

එබැවින් ඉඩම අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1933ක්වූ අප්‍රේල් 27වෙනි දින පස්වරු 3ගේ කනිසමට මෙම කන්තෝරුවේදී මා ඉදිරිපිටට පැමින ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1933ක්වූ මාර්තු මස 20වෙනි
දින කොළඹ කච්චේරියේදීය.

ආර්. ඇස්. වී. පව්ලියර්,
ආණ්ඩුවේ උප ඒජන්ත වමින.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3වෙනි ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—මාවිල්මඩ ගමේ ස්වභාෂා පාඨශාලාවක් සෑදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" නමවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩම්නම් :—

සිතියමේ නො. A 11. ගම—මහනුවර පලාතේ මහනුවර නගර සීමාතුළ පිහිටි මාවිල්මඩ.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | කිරිඅඹේහේන නොහොත් ඉල්ලුක, වත්පනම් නොම්මර 208 (මාවිල්මඩ) | එළිකර තිබෙන මුඩු බිම, අවුරුදු 10ක් වයසැති කොස් ගහක් තිබේ | සියඹලාගස්තැන්නේ පනික්කිහේනයලැගෙදර නොහොත් හර්අප්පුල්ලනහේනයලැගෙදර කුඩා හේනයාගේ උරුමක්කාරයෝ වන ලේන්හුවා හේනයා, කිරිඋක්කුවා හේනයා, ජනා හේනයා සහ කුඩාරිදී සහ සෙනෙ නොහොත් සිරිසේන | 0 3 33·6 |

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 2 | සිරාඅංබවත්ත, පහළ නොම්මර 209 (මාවිල්මඩ) | වරී වත්ත .. | හඳුඅප්පුල්ලගේ හේනයලෑගෙදර නොහොත් ඉහලගේනේ ගෙදර කිරිඋක්කු සහ ඇගේ දරුදෙන්නා වන දිගිසා සහ මැණිකී සහ හඳුඅප්පුල්ලගේ හේනයලෑගෙදර නොහොත් ඉහලගේනේගෙදර ලේන්හුවා වෙද හේනයා | 0 3 15 |

එබැවින් ඉඩම් අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වෂී 1933ක්වූ අප්‍රේල් මස 21වෙනි දින පස්වරූ 2ටක් කාලයට මහනුවර කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වෂී 1933ක්වූ මාර්තු මස 20වෙනි දින
මහනුවර කච්චේරියේදීය.

ඩබ්ලිව්. ඩී. ගොඩ්සෝල්,
මහනුවර ආණ්ඩුවේ උප ඒජන්ත වම්හ.

---

වෂී 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3යේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම්:—හඟුගල පාඨශාලා ගෘහයක් තැනීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වෂී 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට, උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩමනම්:—

අතුරු සිතියම නො. 1 මුල් සිතියමේ නො. 71. ගම—හඟුගල.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 3L1 | වලමගවත්ත නොහොත් සෙත්ලේ වත්ත | වත්ත, එලවළු වවා තිබේ මඩිත්තනා අතු සෙවිලි කළ පාඨශාලාවක්ද, ගුරුනිවාසයක් සහ කුස්සියක්ද තිබේ | කතුරුපිටියේ ඇල්. බී. සේද රිජිස්ට්‍රාර්ද, හඟුගල තිබ් බොටුදෙනියේ කාංකානන්ගෙ අන්ද්‍රිස්ද, එම බබුන් අප්පුද, එම ජන්වින් සහ කුලසින්ගෙ ජේම්ස්ද, ඒ පාසැලේ ගුරුවරයාවූ වී. ජී. ජයවර්ධන විසින් වැවිල්ලට අයිතිකාරකියනු ලැබේ, එහි තිබෙන ගොඩනැගිලි හඟුගල ගම්වාසීන් විසින් සාද දුනට ගම්බද පාඨශාලා සම්බන්ධ දිස්ත්‍රික් කොමිටිය විසින් පාලනය කරනු ලැබේ | 0 1 35·6 |

එබැවින් ඉඩම අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදු ජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇතතාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වෂී 1933ක්වූ මැයි මස 4වෙනි දින පෙරවරු 10යේ කාලයට තිරම බංගලාවේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒට ඇතතාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වෂී 1933ක්වූ මාර්තු මස 14වෙනි
දින හම්බන්තොට කච්චේරියේදීය.

ඈර්ජ්. ලිව්,
ආණ්ඩුවේ උප ඒජන්ත වම්හ.

---

වෂී 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3යේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—හෙට්ටිමුල්ල-හත්ගම්පොල පාරේ නො. 3/7 පාලම ලඟ පාර වෙනස්කිරීම පිණිය මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වෂී 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණ ලැබීතිබේ, ඒ ඉඩම්නම්:—

සිතියමේ නො. A 2. ගම—දෙබත්ගම උඩබාගේ.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | කිතුල්දෙනිය .. | පාර (අළුත්) .. | ඇස්. පී. රන්කිරා .. .. .. | 0 0 1·5 |
| 2 | එම .. | කුඹුර .. | එම .. .. .. | 0 0 2·4 |
| 3 | වතුකන්දෙනිය .. | එම .. | ආර්. පී. කිරිඋක්කුවා, ආර්. පී. රත්තරනා, ආර්. පී. සෙතුවා සහ ජී. එච්. සෙන්දියා | 0 0 2·4 |
| 4 | එම .. | පාර (අළුත්) .. | එම .. .. .. | 0 0 21·6 |
| 5 | එම .. | කුඹුර .. | එම .. .. .. | 0 0 3·3 |
| 6 | එම .. | එම .. | ආර්. පී. රත්තරනා, ආර්. පී. සෙතුවා, ආර්. පී. සිරිමලා, ආර්. පී. සිරිපිනා, ආර්. පී. සියාතුවා, ආර්. පී. සිරිමලී, ආර්. පී. උක්කුඅම්මා සහ ආර්. පී. ලයිසා | 0 0 1·7 |
| 7 | එම .. | පාර (අළුත්) .. | එම .. .. .. | 0 0 4·1 |
| 8 | එම .. | කුඹුර .. | එම .. .. .. | 0 0 1 |

එබැවින් ඉඩම් අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදු ජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වෂී 1933ක්වූ මැයි මස 2වෙනි දින පෙරවරු 10යේ කාලයට කෑගල්ලේ කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වෂී 1933ක්වූ මාර්තු මස 13වෙනි දින
කෑගල්ලේ කච්චේරියේදීය.

ඒ. එච්. ලුසැම්,
ආණ්ඩුවේ උප ඒජන්ත වම්හ.

---

ඉඩම් නිරවුල්කිරීම සම්බන්ධ ප්‍රාරම්භ දැන්වීම.

1931යේ ඉඩම් නිරවුල්කිරීමේ ආඥාපණතයි.

නිරවුල්කිරීමේ දැන්වීම නො. 375 (මහනුවර).

මීට යාකර තිබෙන උප ලේඛනයෙහි විස්තරවෙන ඉඩම්වලින් කිසිවක් හෝ ඒ ඉඩම්වල යම්කිසි කොටසක් නොහොත් ප්‍රයෝජනයක් ගැන යම් කෙනෙකුට යම් අයිතිවාසිකමක් ඇත්නම් එය වෂී 1933ක්වූ මාර්තු මස 24වෙනි දින පටන් තුන්මාසයක ඇතුළත මෙහි පහත අත්සන්කරණ මාවෙත ඉදිරිපත් නොකළොත් එකී ඉඩම රජසන්තක ඉඩමකැයි 1931යේ ඉඩම් නිරවුල්කිරීමේ ආඥාපණතේ 5 (1) වන වගන්තිය යටතේ ප්‍රකාශකරනුලබන බවද රජසන්තක ඉඩමක් වශයෙන් ගෙන ඒට කටයුතුකරණ බවද එකී ආඥාපණතේ 4වන වගන්තිය යටතේ මෙයින් දැනුම්දෙනු ලැබේ.

වෂී 1933ක්වූ පෙබරවාරි මස 22වෙනි දින මහනුවර කච්චේරියේදීය.

ඩබ්ලිව්. ඩී. ගොඩ්සෝල්,
මහනුවර ආණ්ඩුවේ උප ඒජන්ත උන්නාන්සේ වම්හ.

(*a*) මෙම ඉඩම්ගැන වැඩිදුර තොරතුරු මධ්‍යම දිසාවේ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවාගේ සිතියම් සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

(*b*) මෙකී ඉඩම්වලට නොහොත් එයින් එකකවත් උඩින් යන යම් පාරකට අයිතිකම්කීම, ඒ ඉඩමට නොහොත් ඉඩම්වලට අයිතිකම් කීම හැටියට භාරගනු ලැබේ.

උප ලේඛනය.

මධ්‍යම දිසාවේ මහනුවර පලාතේ හාරිස්පත්තුව කෝරළයේ ගලසියපත්තුකෝරලේ මැදගොඩ යන ගමේ පිහිටා තිබෙන මෙහි පහත සඳහන් මායිම්වලට මැදිවූ පහත දක්වන බිම්කැබලි, එනම් :—

උතුරට : බී. ඇම්. ඩිංගිරිබන්ඩා සහ තවත් අය අයිතිකම් කියන උනමේහේන සහ යූ. බී. මැදගොඩකෝරාල අයිතිකම් කියන අලගොඩදෙනියේ කුඹුර.

නැගෙණහිරට : පිසිරිකුමාරිහාමි අයිතිකම්කියන ගල් කැටියාගෙල්ලේහේන.

දකුණට : පිසිරිකුමාරිහාමි අයිතිකම්කියන අටලහකුඹුර.

බස්නාහිරට : වවරඹේඇල, ඇම්. උක්කුමැණිකා අයිති කම්කියන විහාරේගෙදරහේන සහ බී. ඇම්. ඩිංගිරිබන්ඩා සහ තවත් අය අයිතිකම්කියන උනමේහේන.

මූල් සිතියමේ නො. 6,089.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | | බිම්තරම, අ. රූ. ප. | |
|---|---|---|---|---|
| 268 | වල්අරඹේහේන (ඇලට සහ දෙලට ඉතුරු කරත්බෙන බිම) .. | .. 0 | 3 | 12 |
| 269 | වල්අරඹේහේන .. | .. 0 | 1 | 14 |
| | | 1 | 0 | 26 |

---

1931 ක් ඉඩම් නිරවුල්කිරීමේ ආඥාපණතයි.

නිරවුල්කිරීමේ දැන්වීම නො. 376. (මහනුවර).

මීට යාකර තිබෙන උප ලේඛනයෙහි විස්තරවෙන ඉඩම්වලින් කිසිවක් හෝ ඒ ඉඩම්වල යම්කිසි කොටසක් නොහොත් ප්‍රයෝජනයක් ගැන යම් කෙනෙකුට යම් අයිතිවාසිකමක් ඇත්නම් එය මේ 1933ක්වූ මාර්තු මස 24වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළත මෙහි පහත අත්සන්කරණ මා වෙත ඉදිරිපත්නොකලොත් එකී ඉඩම රජසන්තක ඉඩමකැයි 1931ක් ඉඩම් නිරවුල්කිරීමේ ආඥාපණතේ 5 (1) වන වගන්තිය යටතේ ප්‍රකාශකරනුලබන බවද රජසන්තක ඉඩමක් වශයෙන් ගෙන ඊට කටයුතුකරනු බවද එකී ආඥාපණතේ 4වන වගන්තිය යටතේ මෙයින් දැනුම්දෙනු ලැබේ.

මේ 1933ක්වූ පෙබරවාරි මස 22වෙනි දින මහනුවර කච්චේරියේදීය.

ඩබ්ලිව්. බී. ගොඩ්සෝල්,
මහනුවර ආණ්ඩුවේ උප ඒජන්ත උන්නාන්සේ වම්හ.

(*a*) මෙම ඉඩම් ගැන වැඩිදුර තොරතුරු මධ්‍යම දිසාවේ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවාගේ සිතියම් සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

(*b*) මෙකී ඉඩම්වලට නොහොත් එයින් එකකවත් උඩින් යන යම් පාරකට අයිතිකම් කීම, ඒ ඉඩමට නොහොත් ඉඩම්වලට අයිතිකම් කීම හැටියට භාරගනු ලැබේ.

උප ලේඛනය.

මධ්‍යම දිසාවේ මහනුවර පලාතේ පාතහේවාහැට කෝරළයේ ගන්දහය දකුණු කෝරලේ බූටාවත්ත යන ගමේ පිහිටා තිබෙන මෙහි පහත සඳහන් මායිම්වලට මැදිවූ පහත දක්වන බිම්කට්ටි දෙක, එනම් :—

උතුරට : එච්. අප්පුහාමි, ඩබ්ලිව්. කිරිබන්ඩා සහ තවත් අය අයිතිකම්කියන කොල්ලන්වැල්පිටිය සහ ගම්සභාපාර.

නැගෙණහිරට : ඇස්. සින්නයියා අයිතිකම්කියන කොල්ලන්වැල්පිටිය.

දකුණට : එච්. අප්පුහාමි, ඩබ්ලිව්. කිරිබන්ඩා සහ තවත් අය අයිතිකම්කියන කොල්ලන්වැල්පිටිය සහ ගම්සභාපාර.

බස්නාහිරට : ඊ. අප්පුහාමි සහ තවත් අය අයිතිකම් කියන කොල්ලන්වැල්පිටිය.

මූල් සිතියමේ නො. 9,145.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | | බිම්තරම, අ. රූ. ප. | |
|---|---|---|---|---|
| 1 | කොල්ලන්වැල්පිටිය .. | .. 0 | 0 | 33·6 |
| 2 | (ගම්සභාපාර) .. | .. 0 | 0 | 1·6 |
| | | 0 | 0 | 35·2 |

1931 ක් ඉඩම් නිරවුල්කිරීමේ ආඥාපණතයි.

නිරවුල්කිරීමේ දැන්වීම නො. 377 (නුවරඑළිය).

මීට යාකර තිබෙන උප ලේඛනයෙහි විස්තරවෙන ඉඩම්වලින් කිසිවක් හෝ ඒ ඉඩම්වල යම්කිසි කොටසක් නොහොත් ප්‍රයෝජනයක් ගැන යම් කෙනෙකුට යම් අයිතිවාසිකමක් ඇත්නම් එය මේ 1933ක්වූ මාර්තු මස 24වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළත මෙහි පහත අත්සන්කරණ මා වෙත ඉදිරිපත් නොකොලොත් එකී ඉඩම රජසන්තක ඉඩමකැයි 1931ක් ඉඩම් නිරවුල්කිරීමේ ආඥාපණතේ 5 (1) වන වගන්තිය යටතේ ප්‍රකාශකරනුලබන බවද රජසන්තක ඉඩමක් වශයෙන් ගෙන ඊට කටයුතු කරණබවද එකී ආඥාපණතේ 4වන වගන්තිය යටතේ මෙයින් දැනුම්දෙනු ලැබේ.

මේ 1933ක්වූ පෙබරවාරි මස 1වෙනි දින නුවරඑළියේ කච්චේරියේදීය.

ඩබ්ලිව්. ජේ. ඇල්. රොජර්සන්,
ආණ්ඩුවේ උප ඒජන්තතැන වම්හ.

(*a*) මෙම ඉඩම් ගැන වැඩිදුර තොරතුරු නුවරඑළියේ උප ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවාගේ සිතියම් සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

(*b*) මෙකී ඉඩම්වලට නොහොත් එයින් එකකවත් උඩින් යන යම් පාරකට අයිතිකම්කීම, ඒ ඉඩමට නොහොත් ඉඩම්වලට අයිතිකම්කීම හැටියට භාරගනු ලැබේ.

උප ලේඛනය.

මධ්‍යම දිසාවේ නුවරඑළිය දිස්ත්‍රික්කයේ උඩහේවාහැට කෝරළයේ ගහපලාතකෝරලේ මලුල්ල යන ගම පිහිටා තිබෙන මෙහි පහත දක්වන බිම්කට්ටි, එනම් :—

I.—මූල් සිතියමේ. නො. 8,755.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | | බිම්තරම, අ. රූ. ප. | |
|---|---|---|---|---|
| 2 | කහටගහපිටියවත්ත (ගම්සභාපාරට ඉතුරු කර තිබෙන කොටස) | .. 0 | 0 | 7 |
| 3 | එම .. | .. 0 | 0 | 7 |
| | | 0 | 0 | 14 |

මීට මායිම්—උතුරට බී. කළුමැණිකා විසින් අයිතිවාසිකම්කියන කහටගහපිටියේහේන, උක්කුබන්ඩා සහ තවත් අය විසින් අයිතිවාසිකම්කියන කහටගහපිටියේහේන; නැගෙනහිරට මලුල්ලේ පදිංචි ගෙදරකුඹුරේගෙදර අප්පුහාමි විසින් අයිතිවාසිකම්කියන කහටගහපිටියේවත්ත, (මූල් සිතියමේ නො. 8,755යේ පෙනීයන නො. 4 දරණ බිම්කට්ටිය); දකුණට උඩවත්තේ පදිංචි නාරන්ගස්මුල්ලේගෙදර ඩිංගිරිබන්ඩා විසින් අයිතිවාසිකම්කියන කහටගහපිටියේවත්ත, (මූල් සිතියමේ නො. 8,755යේ පෙනීයන නොම්මර 6 දරන බිම්කට්ටිය) මඑල්ලේ පදිංචි පුවක්ගහකුඹුරේගෙදර සියතු විසින් අයිතිවාසිකම්කියන කහටගහපිටියේවත්ත (මූල් සිතියමේ නො. 8735යේ පෙනීයන නොම්මර 7 දරණ බිම්කට්ටිය); බස්නාහිරට කොත්ගල්ලේ පදිංචි අමරාවතී රනසිංහ හාමිනේ විසින් අයිතිවාසිකම්කියන කහටගහපිටියේවත්ත, (මූල් සිතියම නො. 8,755යේ පෙනීයන නො. 1 දරන බිම්කට්ටිය).

II.—මූල් සිතියමේ නො. 8,755.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | | බිම්තරම, අ. රූ. ප. | |
|---|---|---|---|---|
| 14 | හිඳගල්කන්ද .. | .. 82 | 0 | 14 |
| 15 | එම .. | .. 68 | 0 | 27 |
| | | 150 | 1 | 1 |

මීට මායිම්—උතුරට හකුරුතලේගමේ ගම් මායිම, හඟුරන් කෙත සිට උඩවත්තට යන ගම්සභාපාර, හිඳගල කඳුර, ගෝනාගම්පිටියේ සිට උඩවත්තට යන ගම්සභාපාර; නැගෙනහිරට හිල්පැන්කඳුර; දකුණට මලකඳුර උඩවත්තගමේ ගම්මායිම; බස්නාහිරට ඒ. පුංචිරාල විසින් අයිතිවාසිකම් කියන ගොඩමුදුනේගල්හිරියේහේන මලකඳුර, හකුරුතලේ ගමේ ගම් මායිම.

III.—මූල් සිතියමේ නො. 8,755,

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | | බිම්තරම, අ. රූ. ප. | |
|---|---|---|---|---|
| 12 | හිකපිටියේවත්ත (ගම්සභාපාරට ඉතුරු කර තිබෙන කොටස) | .. 0 | 0 | 8 |
| 13 | වැවේගාඩිකැලේ .. | .. 29 | 1 | 7 |
| 16 | එම .. | .. 13 | 2 | 12 |
| 17 | එම .. | .. 17 | 1 | 33 |
| 18 | මලුල්ලවැව .. | .. 7 | 3 | 35 |
| | | 68 | 1 | 15 |

මීට මායිම්—උතුරට උඩවත්තේ පදිංචි නාරන්ගස්මුල්ලෙ ගෙදර හිංගිරිබන්ඩා විසින් අයිතිවාසිකම්කියන කහටගහ පිටියේවත්ත (මුල් සිතියමේ නො. 8,755හේ පෙනියන නොම්මර 6 සහ 5 දරන බිම්කට්ටි), ජී. උක්කුබන්ඩා සහ තවත් අය විසින් අයිතිවාසිකම්කියන කහටගහපිටියේහේන, කිරිබන්ඩා විසින් අයිතිවාසිකම්කියන ගොඩමූදුනේහේන ; නැගෙණහිරට බඩිලිව්. හේරත්හාමි විසින් අයිතිවාසිකම්කියන ගොඩමූදුනේහේන, උඩවත්තගමේ ගම් මායිම ; දකුණට ගලඋඩ සිට හඟුරන්කෙතට යන දිස්ත්‍රික් රෝඩ්කොමිටි පාර, හඟුරන්කෙත ආර්. ඊ. ඇස්. ද සොයිසා මහතා විසින් අයිතිවාසිකම් කියන ගල්බොක්ක (පිඹුරුකඩදසි නො. 51,743) පුරුකැලේහේන, පරනපාර සහ ඒව ඉතුරුකර තිබෙන කොටස නැසී ගිය අබේගුනසේකර මුහන්දිරම්ගේ උරුමක්කාරයින් විසින් අයිතිවාසිකම්කියන පේරකැලේ (පිඹුරුකඩදසි නොම්මර 90,115 සහ 88,152) ආණ්ඩුව විසින් අයිතිවාසිකම්කියන වැවගාවාවත්ත (මුල් සිතියමේ නො. 8,755හේ පෙනියන නොම්මර 19 දරන බිම්කට්ටිය), ගෙදරකුඹුරේගෙදර මුදියන්සේ විසින් අයිතිවාසිකම්කියන වැවකැටිය නොහොත් මූල්බලියවත්තේහේන (පිඹුරුකඩදසි 91,890), ආණ්ඩුව විසින් අයිතිවාසිකම් කියන පාරට ඉතුරුකර තිබෙන කොටස හඟුරන්කෙත සිට ගෝනාගම්පිටියට යන ගම්සභාපාර, අඹිපාර, කේ. අප්පුහාමි විසින් අයිතිවාසිකම්කියන කුපාලෙවත්ත, ටී. බී. ඉලන්ගන්තිලක සහ තවත් අය විසින් අයිතිවාසිකම්කියන නිකපිටියේහේන, මහනුවර ටී. බී. ඉලන්ගන්තිලක පෙරකදෝරු මහතා විසින් අයිතිවාසිකම්කියන නිකපිටියේවත්ත (මුල් සිතියමේ නො. 8,755 පෙනියන නො. 11 දරණ බිම්කට්ටිය) ඇස්. හිංකිරිඅම්මා සහ තවත් අය විසින් අයිතිවාසිකම්කියන කහටගහපිටියේහේන.

---

## වැන්ඩර්ස් නම් ඉල්ලුම්පත්‍ර පිළිබඳ දැන්වීම.

### තබ්බෝවේ ඉඩම් සශ්‍රීකකිරීමේ ව්‍යාපාරය.

පුත්තලමට නැගෙනහිරින් හැතැප්ම අටක් පමණ ඈතින් පිහිටි තබ්බෝව වැවෙහි වතුර ලබාගෙන වී ගොවිතැන් කිරීමට සුදුසු ඉඩම්කට්ටි ඉල්ලා එවන ඉල්ලුම්පත්‍ර වර්ෂ 1933ක්වූ අප්‍රේල් මස විසිදෙවෙනි (22) දින දක්වා භාරගනු ලබන බැව් මෙයින් දැනුම්දෙනු ලැබේ. ඉල්ලුම්පත්‍ර ලියා පුත්තලමේ උප දිසාපතිතුමාට යැවිය යුතුයි. ඉල්ලුම්කරුවන් විසින් එහි තමන්ගේ සම්පූර්ණ නම් හා ලියුම් ලැබෙන ක්‍රමය ලියයුතුයි. ඉඩම්කට්ටි දීමට සුදුස්සන් තේරීම පිණිස වර්ෂ 1933ක්වූ අප්‍රේල් මස 22වෙනිදාසින් පසු ඉඩම් කච්චේරියක් හෝ කීපයක් පවත්වනු ලැබේ, කච්චේරි පැවැත්වීම ගැන දැනුම්දෙනු ලැබේ. කච්චේරියේ බැඳීම පිණිස මුදලක් ඉල්ලුම්පත්‍ර සමග එවීම උවමනා නැත.

2. බෙදදීම් පිණිස ගොඩබිම් සහ මඩබිම් යන දෙවගයම තිබේ. ආණ්ඩුවේ උප දිසාපතිතුමාට සුදුසුයයි වැටහෙනොත් කොයියම් ඉල්ලීමක් වුවත් ප්‍රතික්ෂේපකල හැකිය. තවද තෝරාගත් එක් එක් ඉල්ලුම්කරුට දෙන බිම් ප්‍රමාණයද, තෝරාගත් ඉල්ලුම්කරුවන්ට ඉඩම්කට්ටි වෙන්කරන අඳුමද එතුමා විසින් නිශ්චයකරනු ලැබේ. එසේ වෙන්කරදීම සම්බන්ධ සියලුම ප්‍රශ්නවලදී එතුමාගේ තීරණය අවසාන තීරණය වේ.

3. කට්ටි වශයෙන් වෙන්කරනලද්දුව මෙකී ඉඩම් සහ වෙනත් ඉඩම් ලබන අයගේ භුක්තිය සවිකර හෙවත් ස්ථිර කරලීම පිණිස ආඥාපණතක් පනවාගැනීමට අදහස්කර තිබේ. මේ ආඥාපණත පැනවූවිට ඒට මේ ඉඩම් යටත්වන බවත් එය වලංගුවීමට ප්‍රථමයෙන් නිකුත්කරණලද මොනයම් අවසර පත්‍රයක වුවත් පෙනෙන පොරොන්දු හා නියමයන් වෙනස් වියහැකි බවත් ඉල්ලුම්කරුවන් වෙත මෙයින් දැනුම්දෙනු ලැබේ. මේ අවසරපත්‍ර පහත පෙනෙන පොරොන්දුවලට යටත් වේ :—

(1) අවසරපත්‍රය පස් අවුරුද්දකට නිකුත්කරණු ලැබේ.

(2) අවසරපත්‍රලත් අය විසින් කුඹුරු ඉඩම් අස්වැද්දීමත් ගොඩ ඉඩම් වවා සශ්‍රීකකිරීමත් පළමුවෙනි අවුරුද්ද ඇතුළතදී පටන්ගතයුතුයි. ඔහු විසින් ආණ්ඩුවේ උප දිසාපතිතුමාට සුදුසුයයි ඒත්තුගතහැකි අන්දමින් අවුරුද්දක් පාසාම වැඩකරගෙන ගොස් පස්වෙනි අවුරුද්ද අවසානයේදි වැඩය සම්පූර්ණ කල යුතුයි. ඉන්පසු ඔහු විසින් අවුරුදුපතා ඉඩමේ යටත්පිරිසෙයින් හතරෙන් තුන් කොටසක ගොවිතැන් වැඩිලිකල යුතුයි.

(3) අවසරලත් අය වර්ෂයකට අක්කරයකට ශත පණහ බැගින් වාර්ෂික බද්දක් කලින් ගෙවිය යුතුයි.

(4) අවසරපත්‍රලත් අය තුන් අවුරුද්දක් (ඉඩම) භුක්ති වින්දට පසු ආණ්ඩුවෙන් නියමකරන පරිදි අස්වැද්දියහැකි ඉඩම්වලට වතුර සැපයීම ගැන බද්දක් ගෙවීමට යටත්වේ. මෙය පටන්ගැනීමේදී අක්කරයකට අවුරුද්දකට රුපියල් දෙකකට වඩා නොවේ.

(5) දැනට පවතින හෝ මින්මතු නීතිප්‍රකාර පණවනු ලබන හෝ වතුර සැපයීම හා ගෙවිතැන්කිරීම සම්බන්ධ සියලුම ව්‍යවස්ථාවලට අවසරලත් අය යටහත්විය යුතුයි.

(6) ඉඩමේ වැටවල් බැඳීමට හෝ ඉඩමේ මුරපැලවල් හෝ ගෙවල් තනාගැනීමට හෝ ඉඩමේ ලීදඬු ගැනීමට අවසරපත්‍රලත් අයට අයිතිවාසිකම් තිබේ. නමුත් අවසර නැතුව ඉඩමෙන් කිසිම දුවදඬු ආදියක් ඉවත ගෙනයෑමට ඔහුට කිසිම බලයක් නැත. මේ අවසරය දෙනුලබන්නේ ගෙවීම නොගෙවීම සම්බන්ධව නිශ්චයකරන්නා පොරොන්දුපිට වේ.

(7) අවසරලත් අය තමන්ට වෙන්කරදුන් ඉඩමේ උප දිසාපතිතැන මැනවයි පිළිගන්නා අන්දමේ ගෙයක් තනා එහි වාසයකල යුතුයි.

(8) අවසරපත්‍රය ලත් අය විසින් ආණ්ඩුවේ උප දිසාපතිතුමාගේ අවසරය නොමැතිව, මෙම අවසර පත්‍රයෙන් ඔහුට ඇති අයිතිවාසිකම, කවර අන් දමකින්වත් විකිණීම, උකස් තැබීම, හෝ වෙන අන්දමේ අන්සතුකිරීමක් කළ නොහැකිය. එවැනි විකිණීම් උකස්තැබීම් හෝ අන්සතුකිරීම් වලංගු නොවේ.

(9) අවසරලත් අය අවසරපත්‍රයේ නියමවලින් යම්කිසිවක් ඉෂ්ටනොකොලොත් හෝ එකී ඉඩමවත් අවසරලත් අයට ඉන් ඇති පලප්‍රයෝජනයක්වත් අවසරලත් අයට විරුඹව පිටස්කරනලද ඇස්කිසියක් පිට නහනමට ගත්තොත් හෝ අවසරය අවලංගුකරන්නටද ඉඩම හා එහි තිබෙන යම් අස්වැන්නක්, වගාවක් ගොඩනැගිල්ලක් හෝ වෙනයම් දියුණුවක් නම අත්අඩංගුවට ගන්නටද ආණ්ඩුවේ උප දිසාපති තැනට පුළුවන. එසේම ණයද නොව අවසරලත් අය හෝ වෙනයම් කිසි කෙනෙකු විසින් ඒ ඉඩමෙහි කරණලද යම් දියුණුවක් සඳහාවූ පාඩුව ගැන අවසරලත් අයටවත් ඔහු වෙනුවෙන් අයිතිවාසිකම් කියන වෙනයම් කෙනෙකුටවත් අලාභයක් ඉල්ලන්නට කිසිම අයිතිවාසිකමක් නැත.

(10) අවසරලත් අයට වෙන්කොට දුන් ඉඩමෙන් පාරවල් ඇලවල් හෝ වෙනයම් කටයුත්තක් සඳහා මින්මතු ආණ්ඩුවට උවමනාකරන යම් කොටසක් ඇත්නම් එය වන්දියක් නැතුව භාරදියයුතුයි.

(11) අවසරපත්‍රය ලත් අය විසින් එම පත්‍රයේ සඳහන් කාලයතුලදි තමාගේ මරණයෙන් පසු ආණ්ඩුවේ උප දිසාපතිතුමා විසින් අළුත් අවසරපත්‍රයක් දීමට සුදුස්සා කවිද යන වග නියමකළ යුතුය.

(12) අවසරපත්‍රය එම පත්‍රයලත් අයගේ පුද්ගලික දෙයක් වේ. එය ඔහුගේ මරණය සමගම කෙලවර වන්නේය.

(13) ඉහත සඳහන්කල ආඥාපණත ක්‍රියාවෙහි යෙදවීමට පටන්ගැන්මේදී හැර වෙන අන්දමකින් මෙම අවසරපත්‍රය කෙලවරවනවිට එම ඉඩම නැවත ආණ්ඩුවට අත්වේ. එහි කරණලද කිසියම් දියුණුවක් සඳහා ආණ්ඩුවෙන් වන්දි මුදලක් ඉල්ලීමට කිසිම අයෙකුට බලයක් නැත.

(14) අවසරපත්‍රය ලත් අයගේ මරණය කරණකොට ගෙන එම අවසරපත්‍රය කෙලවරවීමේදී ඔහු විසින් පත්කරණලද අය සුදුසුය කියා වැටහේ නම් එම අයට හෝ ඔහුගෙන් රැකෙන අයෙකුට හෝ නැත්නම් වෙනයම් අයෙකුට අළුත් අවසර පත්‍රයක් උප දිසාපතිතුමාගේ කැමැත්තේ ප්‍රකාර දීමට හෝ නොදීමට බලය තිබේ.

අත්සන්කලේ,

සී. වී. බ්‍රෞන්,

ඉඩම් කොමසාරිස් තැන.

වර්ෂ 1933ක්වූ මාර්තු මස 21වෙනි දින කොළඹදීය.

---

PRINTED AT THE CEYLON GOVERNMENT PRESS, COLOMBO.